**නාමල්ඔය ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**-----------------------**

**1 මූල්‍ය ප්‍රකාශන**
**--------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මැයි 01 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 19 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට නාමල්ඔය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
------------------------------------------

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවට අයිත් වාහන 16 ක වටිනාකම රු.31,780,414 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.36,623,794 ක් ලෙස දැක්වීම හේතුවෙන් ජංගම නොවන වත්කම් රු.4,843,380 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසන් තොග වටිනාකම රු.19,397 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.34,527 ක් ලෙස වශයෙන් දැක්වීම නිසා ජංගම වත්කම් රු.15,130 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල වැඩ අවසන් කර තිබුණු රු.372,8151 ක් වටිනා කොම්පෝස්ට් අංගනය තුල ඉදිකල ව්‍යාපෘති 04 ක වටිනාකම ප්‍රාග්ධනිත නොකිරීම නිසා ජංගම නොවන වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) පොල්වත්ත කොම්පෝස්ට් මධ්‍යස්ථානයේ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියට අදාලව රු.106,264 ක් වූ සංවර්ධණ ණය හිමියෝ ගිණුම්ගතකර නොතිබීම හේතුවෙන් ජංගම වගකීම එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ස්ථාවර තැන්පතු රු.500,000 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු.50,000 ලෙස දැක්වීම නිසා ස්ථාවර තැන්පත් රු.450,000 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසන් දිනට ගිවිසුම් ඇප ශේෂය රු.84,439 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.181,390 ලෙස දැක්වීම නිසා ජංගම වගකීම් රු.96,951 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට විවිධ තැන්පත් ශේෂය උපලේඛනය අනුව රු.447,600 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල රු.653,096 ක් ලෙස දක්වා තිබීම නිසා ජංගම වගකීම් රු.205,496 කින් වැඩියෙන් දක්වා තිබුණි.

**1.3.2 නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්.**

නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති සහ රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | ප්‍රදේශීය සභා රීති මාලාව රීති 59 - 66 | සෑම වර්ෂයකම ආරම්භයේදී ප්‍රදේශය තුල සමීක්ෂණයක් පවත්වා කර්මාන්ත බදු අයකල යුතු ආයතන හඳුනාගෙන ඒවා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016 | ධාවන මට්ටමේ පවතින වාහන 06 ක් සම්බන්ධයෙන් ඉන්ධන පරීක්ෂාව සිදුකර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,300,493ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,207,167 ක විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් සහ හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම් | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) වරිපනම් හා බදු | 315,000 | 75,550 | 75,550 | - | 20,000 | 7,620 | 7,620 | - |
| (ii) කුලී ආදායම් | 2,358,600 | 1,843,205 | 1,829,063 | 50,690 | 1,979,920 | 1,657,802 | 1,652,146 | 36,548 |
| (iii) බලපත්‍ර ගාස්තු | 256,000 | 287,670 | 293,470 | 22,505 | 453,000 | 346,440 | 346,035 | 28,305 |
| (iv) වෙනත් ආදායම් | 2,101,000 | 1,299,987 | 880,430 | 977,408 | 1,574,000 | 1,555,396 | 1,635,263 | 557,852 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාව විසින් 2017 දෙසැම්බර් 31 දිනට අයකළ යුතු මුළු ආදායම රු.4,129,117 ක් වූ අතර,වර්ෂය තුල රු.3,078,513ක් අයකර ගෙන තිබුණි. ඒ අනුව ආදායම් රැස් කිරීමේ ප්‍රතිශතය සියයට 74.55 ක මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

### 2.2.3 වෙනත් ආදායම්

2009 අප්‍රේල් 17 දිනැති අංක1597/8 දරන ගැසට් පත්‍රය ප්‍රකාරව එක් දූරකථන කුළුණක් සඳහා අනුමැතිය ලබාදීමට අවම වශයෙන් රු.20,000 බැගින් අයකල යුතු වුවද, සභා බල ප්‍රදේශයේ පවතින දූරකථන කුළුණු 09 ක් සඳහා රු.180,000 ක් අයකර නොතිබුණි.

### 2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.454,124ක් හා මුද්දර ගාස්තු රු.469,659 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව සභාවට අයත් රු.5,615 ක් වටිනා පුස්තකාල පොත් 51 ක් අස්ථානගත වීම සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) 2013 වර්ෂයට පෙර සිට පැවත එන සේවක ණය රු.39,388 ක් අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ඇ) 2009 අප්‍රේල් 16 දිනැති 09/2006 චක්‍රලේඛ ප්‍රකාරව 2017 වර්ෂයේ දී රු.63,200 ක් වැයකර ස්ථාපිත කළ ඇඟිලි සලකුණු යන්ත්‍රය ක්‍රියා විරහිත වී තිබුණු අතර, එය අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2017 භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිර්දේශ මත සුන්බුන්ව පවතින කැබ් රථයක් අපහරණය කිරීමට නිර්දේශ කර තිබුණද සභාව විසින් එය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඉ) මෝටර් ග්‍රේටර් රථය හා බවුසර් ට්‍රේලරයේ අයිතිය නියමිත දිනවල දී පවරා නොගැනීම නිසා අයිතිය පවරා ගැනීමේ දී රු.4,800 ක ප්‍රමාද ගාස්තු ගෙවා තිබුණි.

### 3.2 මානව සම්පත් කළමනාකරණය

සභාවේ 2017 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලයේ ලේකම් හා පුස්තකාලයාධිපති ඇතුලුව තනතුරු 05 ක් සඳහා නිලධාරීන් 06 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි.

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

සමාලෝචිත වර්ෂය සඳහා දුරකථන කුළුණු 04 ක් මඟින් ලබාගත යුතු බලපත්‍ර ගාස්තු රු.12,000 අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

### 3.4 වත්කම් කළමනාකරණය

#### 3.4.1 නඩත්තු හා අලුත්වැඩියා නොකිරීම

සභාව සතු රු.3,794,700 ක් වටිනා වාහන 05ක් ධාවන මට්ටමේ නොපැවතුණු අතර, එම වාහන අලුත්වැඩියා කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

#### 3.4.2 පවරානොගත් වත්කම්

සභාව විසින් භාවිතා කරනු ලබන ඉඩම් කොටස් 52 ක අයිතිය සභාවේ නමට පවරාගෙන නොතිබුණි.

#### 3.4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

සභාවට අයත් ධාවන මට්ටමේ පවතින රු.6,300,000 වටිනා නවීන ලොරි බවුසරය සමාලෝචිත වර්ෂය තුළ දී 94km පමණක් ධාවනය කර තිබුණි.

#### 3.4.4 වාහන උපයෝජනය

සභාව සතු වාහන 19 ක් සඳහා ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණු අතර, වාහන 17 ක් සඳහා රක්ෂණාවරන ලබාගෙන නොතිබුණි.

## 3.5 ප්‍රසම්පාදනය

---

### 3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම

---

2006 මාර්තු 24 දින නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ අංක 128 අනුව සභාව විසින් 2017 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---

### 4.1 අයවැය පාලනය

---

සමාලෝචිත වර්ෂයේ අයවැයගත සහ තථ්‍ය වියදම අතර සියයට 05 සිට සියයට 62 දක්වා පරාසයක විචලනයක් පැවති බැවින්, අයවැය ලේඛනය සඵල කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

## 5. පද්ධති හා පාලනය

---

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානය යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකල යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | - | වත්කම් ගිණුම්ගත නොකිරීම. |
| (ආ) | අයවැය පාලනය | - | අයවැය නිසිලෙස පිළියෙල නොකිරීම. |
| (ඇ) | තොග | - | ක්ෂණිකව හරි වැරදි බැලිය හැකි ආකාරයට තොග ගබඩා නොකිරීම |
| (ඈ) | ණයගැති හා ණයහිමි | - | (i) උපලේඛන පිළියෙල නොකිරීම<br>(ii) කාල විශ්ලේෂණ පිළියෙල නොකිරීම |
| (ඉ) | සේවක කළමණාකරණය | - | පුරප්පාඩු සම්පූර්ණ කර නොගැනීම |
| (එ) | ව්‍යාපෘති හා කොන්ත්‍රාත් | - | ප්‍රමාණවත් අධීක්ෂණයක් නොමැති වීම |